සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## කුසලතා කැප්ස්ටෝනය - 2018 ජූලි

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

2018-07-28
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු වෙන් කිරීම:***

| කොටස | අවශ්‍යතාවය | ලකුණු |
|---|---|---|
| A | සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 40 |
| B | ප්‍රශ්න හයෙන් හතරකට පමණක් උත්තර සැපයිය යුතුය. | 60 |
| **මුළු ලකුණු** | | **100** |

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යය යොදා ගනිමින්**, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පක්ෂපාති ගනුදෙනුකරුවන්ට අදාලවන තොරතුරු ගබඩා කිරීම සඳහා 2016 මයික්‍රොසොෆ්ට් ඇක්සස් (Microsoft Access) භාවිත කරමින් දත්ත පදනමක් නිර්මාණය කිරීමට සුපිරි වෙළෙඳසැලක් සැලසුම් කරමින් සිටී. ගනුදෙනුකරුවෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය ගබඩා කිරීම සඳහා වඩාත් යෝග්‍ය දත්ත වර්ගය (data type) වන්නේ:

(1) Yes/No (2) Long Text (3) Short Text (4) Attachment

1.2 තම ආයතනයේ ඉන්වොයිසිවලට සම්බන්ධ තොරතුරු ගබඩා කිරීම සඳහා වෙළෙඳ ආයතනයක් 2016 මයික්‍රොසොෆ්ට් ඇක්සස් භාවිත කරමින් දත්ත පදනමක් නිර්මාණය කිරීමට සැලසුම් කරමින් සිටී. ඉන්වොයිසියේ මුළු වටිනාකම (total invoice amount) ගබඩා කිරීමට වඩාත් යෝග්‍ය දත්ත වර්ගය වන්නේ:

(1) Number. (2) Long Number. (3) Currency. (4) Auto Number.


1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, මයික්‍රොසොෆ්ට් ඇක්සස් (Microsoft Access) භාවිත කරමින් සාමාන්‍යයෙන් විවෘත **නොකරන්නේ** කුමන ගොනු දිගුව (file extension) ද?

(1) ACCDB (2) XLSX (3) PPTX (4) CSV

**1.4** ණය මුදලක ප්‍රමාණය, පොලී අනුපාතිකය සහ වාරිකයක ප්‍රමාණය ගිණුම් විධායකයෙකු දැනගෙන සිටින විට, පහත සඳහන් ශ්‍රිතයන් අතුරෙන් ණය මුදලේ වාරික ගණන ගණනය කිරීම සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් හි (Microsoft Excel) හි, කුමන ශ්‍රිතය ඔහුට / ඇයට භාවිත කළ හැකිද?

(1) PMT (2) PV (3) NPV (4) NPER

**1.5** දකුණු පසින් පෙන්වා ඇති අනුරූපය 2016 මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Microsoft Excel) වලින් උපුටාගත් තිර පිළිබිඹුවකි (screenshot). Members 2016, Members 2017 සහ Members 2018 ලෙස අනුරූපයේ නම්කර ඇති දෑ (objects) සමඟ බොහෝසෙයින් පොදුවේ සම්බන්ධවන නාමය වන්නේ?




(1) වැඩපොත් (Workbooks).
(2) වැඩ පත්‍රිකා (Worksheets).
(3) සූත්‍ර (Formulas).
(4) ශ්‍රිත (Functions).

**1.6** මානව සම්පත් විධායකයෙකු සතියක (දින 7 ක) කාලයක් තුළ සේවකයන්ගෙන් ලැබුණ තිවාඩු අයදුම්පත් ඇතුලත් කරමින් (entering) සිටී. එක් වතාවකට වඩා තිවාඩු ලබාගත් සේවකයන් හඳුනා ගැනීමට ඔහු උත්සහා කරමින් සිටියි. එකම සේවකයාගේ නම ඇතුළු කළ කෝෂ (cells) හඳුනාගැනීමට එක්සෙල්හි පහත සඳහන් අංග අතුරෙන් කුමන අංගය භාවිත කළ හැකිද? *(සියලුම නම් යතුරුලියන දෝෂයකින් තොරව ඇතුළු කරනු ලබන්නේයැයි උපකල්පනය කරන්න)*

(1) IF Condition.
(2) Conditional Formatting.
(3) AutoSum.
(4) Solver.

**1.7** මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් (Microsoft PowerPoint) වලදී ස්ලයිඩවල අනුක්‍රමික අනුපිළිවෙල මගහැර යාමට (bypass) කෙනෙකුට අවශ්‍ය වූ විට, පහත සඳහන් අංග අතුරෙන්, තෝරාගත් ස්ලයිඩයට (slide) මාරුවීම සඳහා කුමන අංගය භාවිත කළ හැකිද?

(1) Action Buttons.
(2) Slide Animations.
(3) Slide Transitions.
(4) Master Slide.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, මයික්‍රොසොෆ්ට් වර්ඩ් ලියවිල්ලක් (Microsoft Word document) ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය කුමක් ද?

(1) ඔබගේ මුරපදය (password) අමතක වුවද, කෙටි පණිවුඩයක් (SMS) ලැබීමෙන් ඔබට එය නැවත ලබා ගැනීමට (recover) හැකිය.

(2) ලේඛනයට ප්‍රවේශවීමට මුරපද වෙනුවට ඇඟිලි සළකුණු භාවිත කළ හැකිය.

(3) ලේඛනයක් සඳහා යොදාගත හැකි මුරපද වර්ග දෙකක් තිබේ.

(4) ලේඛනයකට යොදාගත හැකි මුරපද වර්ග ඇත්තේ එකක් පමණි.

**1.9** **වැරදි** ආකෘතියක් (format) සහිත විද්‍යුත් තැපැල් (email) ලිපිනයක් වන්නේ:

(1) student@institute.edu.lk
(2) student.name@lk
(3) student.university@institute.lk
(4) student.lk@institute.com

**1.10** ශ්‍රී ලාංකීය ගනුදෙනුකරුවෙකුට අන්තර්ජාල බැංකුකරණය, ජංගම (mobile) බැංකුකරණය හෝ ඒටීඑම් (ATM) භාවිත කරමින් එක් ශ්‍රී ලාංකික වාණිජ බැංකුවක සිට තවත් එකකට තත්කාලීනව (real time) අරමුදල් මාරු කිරීමට අවශ්‍යවූ විට, ඒ සඳහා පහසුකම් සලසන ලංකාවේ තිබෙන නවතම සේවාව හඳුන්වනු ලබන්නේ:

(1) Common Electronic Fund Transfer Switch (CEFTS).

(2) Paypal.

(3) Society for Worldwide Interbank Financial Telecommunication (SWIFT).

(4) BitCoins.

*අංක **1.11** සිට **1.16** දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම සුදුසු වචනය වරහන් තුළ දී ඇති වචන අතුරෙන් තෝරන්න. තෝරාගත් වචනය, අදාළ ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න:*

**1.11** විද්‍යුත් තැපැලක් (email) යැවීමේදී එහි පිටපතක් වෙනත් පරිශීලකයන් වෙත ලැබුණ බව සහ තව කවුරුන් වෙත එය යවන ලද්දේ යැයි සහතික කර ගැනීමට ………… *(BCC / CC)* විකල්පය භාවිත කළ හැකිය.

**1.12** අන්තර්ජාල බැංකුකරණය වැනි රහස්‍ය ගනුදෙනු සිදුකිරීමේදී …………. *(HTTP / HTTPS)* නියමාවලිය (protocol) සුදුසු නොවේ.

**1.13** Ctrl + …………. *(C / V)* යන යතුරු සංයෝගය (key combination), මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) වැනි මයික්‍රොසොෆ්ට් ඔෆිස් පැකේජවල (Microsoft Office Packages) තෝරාගත් තොරතුරු පිටපත්කර ගැනීම (copy) සඳහා භාවිතයට ගන්නා කෙටි ක්‍රමයකි (shortcut).

**1.14** පුහුණුවීමකදී (practice), ඉදිරිපත් කිරීමක් (presentation) සඳහා ගනු ලබන කාලය ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය වූ විට, අපට …………. *(Rehearse Timing / Play Narrations)* විකල්පය භාවිත කළ හැකිය.

**1.15** මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හිදී දෘෂ්‍යාකාරයෙන් තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා රූපක (graphics) විදහා දැක්වීමට, ඔබට අවශ්‍ය වූ විට භාවිත කළ හැකි විකල්පවලින් එකක් වන්නේ …………. *(Word Art / Smart Art)* ය.

**1.16** පවර්පොයින්ට් (Power Point) ඉදිරිපත් කිරීමක ඇතුලත ගණනය කිරීම් සඳහා භාවිත කළ හැකි පැතුරුම්පත් ගොනුවක් (spreadsheet file) නිවේශනය කිරීමට (insert) ඔබට අවශ්‍ය වූ විට ඔබ විසින් …………. *(Chart / Object)* නිවේශන අංගය තෝරා ගනියි.

*අංක **1.17** සිට **1.20** දක්වා පහත දී ඇති එක් එක් ප්‍රකාශය, **සත්‍ය** ද, **අසත්‍ය** ද යන්න සඳහන් කරන්න. ඔබේ උත්තරය (සත්‍ය හෝ අසත්‍ය යන්න), අදාළ ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

**1.17** SAP යනු දැනට වෙළෙඳපොළේ තිබෙන ප්‍රධාන පෙළෙහි ERP මෘදුකාංගවලින් එකකි.

**1.18** සදාතන මෘදුකාංග බලපත්‍රයක් (a perpetual software license) නිශ්චිත කාලපරිච්ඡේදයක් අවසානයේ කල් ඉකුත් (expires) වේ.

**1.19** සංයුක්ත ජාලයක (corporate network) අන්තර්ජාල ආරක්ෂාව තර කිරීමට ජාල සර්වරයක් (webserver) භාවිත කළ හැකිය.

**1.20** පහසුවෙන් රැගෙන යා හැකි ගබඩාකරණ උපාංගවලට (portable storage devices) අනවසරයෙන් ගොනු පිටපත් කිරීම බරපතල තර්ජනයක් වන අතර, සංවිධානවලින් තොරතුරු හෙළිදරව්වීමේ (leakage) ප්‍රධානතම ප්‍රභවයක්ද වේ.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

ප්‍රශ්න හතරකට (04) පමණක් උත්තර සැපයිය යුතුය.

(මුළු ලකුණු 60)

### 02 වන ප්‍රශ්නය

ඇඟළුම් නිෂ්පාදකයෙකුගේ දත්ත පදනමක සේවක ලැයිස්තුවකින් උපුටාගැනීමක් පහත ප්‍රදර්ශනය කර ඇත:

| සේවක අංකය | පෙළපත් නාමය | මුල් නම | ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීමේ දිනය | කොන්ත්‍රාත් / පරිවාස කාලය (දින) | මූලික වැටුප (රු.) | උපරිම අතිකාල පැය (මාසයක් සඳහා) | ස්ථිර සේවක |
|---|---|---|---|---|---|---|---|---|
| E1001 | අරුණසිරි | කෙවින් | 800540370 V | 2018-04-01 | 365 | 60,000.00 | 100 | Yes |
| E1002 | පෙරේරා | සඳුනි | 758152400 V | 2018-05-01 | 365 | 75,000.00 | 120 | Yes |
| E1003 | යෝගරාජන් | ගනේශ් | 880510400 V | 2018-05-01 | 180 | 60,000.00 | 80 | No |
| E1004 | සෙල්වරාජා | ආයුෂ්‍යානි | 928210450 V | 2018-05-01 | 180 | 50,000.00 | 50 | No |
| E1005 | රබෙල් | දර්ශන | 702371588 V | 2018-06-01 | 180 | 60,000.00 | 100 | No |
| E1006 | පෙරේරා | විජය | 831812566 V | 2018-06-01 | 365 | 90,000.00 | 120 | Yes |
| E1007 | සුබෙයිර් | ෆස්ලි | 833551789 V | 2018-06-01 | 365 | 60,000.00 | 110 | Yes |
| E1008 | අල්විස් | ජගත් | 861401235 V | 2018-07-01 | 365 | 50,000.00 | 120 | Yes |

**සටහන්:**

- කොන්ත්‍රාත් / පරිවාස කාලය සාමාන්‍යයෙන් මාස 6 ක් හෝ අවුරුදු 1 කි.
- දෙනු ලබන උපරිම අතිකාල මාසයකට පැය 150 බැගිනි.

ඉහත දත්ත පමණක් තිබේයැයි සලකා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර ලියන්න:

(a) (i) ඉහත සඳහන් ක්ෂෙත්‍ර අතුරෙන් ප්‍රධාන ක්ෂේත්‍රය (key field) ලෙස සැලකීමට වඩාත්ම සුදුසු ක්ෂේත්‍රය **තෝරන්න**. (ලකුණු 02)

(ii) ඉහත (i) කොටස සඳහා ඔබගේ තෝරාගැනීමට තුඩුදුන් හේතුව **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) පහත සඳහන් එක් එක් ක්ෂේත්‍රයට වඩාත්ම සුදුසු දත්ත වර්ගය **හඳුනා දක්වන්න**:

| ක්ෂේත්‍රයේ නම | දත්ත වර්ගය |
|---|---|
| සේවක අංකය | |
| පෙළපත් නාමය | |
| ජාතික හැඳුනුම්පත් අංකය | |
| පත්වීමේ දිනය | |
| කොන්ත්‍රාත් / පරිවාස කාලය | |
| මූලික වැටුප | |
| උපරිම අතිකාල පැය | |
| ස්ථිර සේවක | |

(ලකුණු 08)

(c) ඉහත දී ඇති දත්ත සලකා බලමින්, දත්ත පදනම් (databases) සඳහා විමසුම් (queries) ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 15)

## 03 වන ප්‍රශ්නය

ඉලෙක්ට්‍රොනික අයිතම සමාගමක සේවකයන් විසින් කරන ලද විකුණුම් ඇතුළත් මයික්‍රොසොෆ්ට් එක්සෙල් පැතුරුම්පතක උද්ධෘතයක් පහත අනුරූපනයෙන් ප්‍රදර්ශනය කර ඇත:

| | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | |
| 2 | | **Employee Number** | **Name** | **Televisions** | **Refrigerators** | **Microwave Ovens** | **Total Sales Value (Rs.)** | **Sales Commission (Rs.)** | **Tax** |
| 3 | | E1001 | A.B.C. Silva | 10 | 20 | 14 | | | |
| 4 | | E1002 | P.Q. Zubair | 5 | 10 | 12 | | | |
| 5 | | E1003 | G.K. Ganesh | 7 | 6 | 15 | | | |
| 6 | | | | | | | | | |
| 7 | | | | | | | | | |
| 8 | | | **Item** | **Unit Price (Rs.)** | | | | | |
| 9 | | | Television | 60,000 | | | | | |
| 10 | | | Refrigerator | 100,000 | | | | | |
| 11 | | | Microwave Oven | 20,000 | | | | | |
| 12 | | | | | | | | | |
| 13 | | | | | | | | | |

(a) G4 සහ G5 කෝෂවලට යෝග්‍ය වටිනාකම් දීම සඳහා G3 කෝෂය (cell) ට පිටපත් කළයුතු සූත්‍රය **හඳුනා දක්වන්න.** එක් එක් වර්ගය යටතේ විකුණන ලද අයිතම ගණන ඒකකයක මිලෙන් ගුණකර, ඒවා එකට එකතු කර මුළු විකුණුම් වටිනාකම ගණනය කරන්නේයැයි ඔබට උපකල්පනය කළ හැකිය.

*(උදාහරණ වශයෙන්, එක් එක් වර්ගයෙන් ඒකක 1 බැගින් විකුණන ලද්දේ නම්, මුළු විකුණුම් වටිනාකම රු.180,000/- කි.)*

**සටහන:** ඔබ විසින් භාවිත කළ යුත්තේ කෝෂ යොමුවන් (cell references) මිස කෝෂ වටිනාකම් නොවේ. කෝෂ G3 කෝෂයෙහි ප්‍රදර්ශනය වනු ඇති වටිනාකමද **සඳහන් කරන්න**. (ලකුණු 06)

(b) අංක E1001 දරණ සේවකයාගේ විකුණුම් කොමිස් ගණනය කිරීමට H3 කෝෂය සඳහා සූත්‍රය **හඳුනා දක්වන්න.** මුළු විකුණුම් වටිනාකම රු.200,000/- ඉක්මවන්නේ නම්, මුළු විකුණුම් වටිනාකමෙන් 5% ක්ද, එය රු.200,000/- කට සමාන හෝ ඊට අඩුනම් විකුණුම් වටිනාකමෙන් 3% ක්ද ලෙසද, විකුණුම් කොමිස් ගණනය කරන බව ඔබට උපකල්පනය කළ හැකිය. (ලකුණු 03)

(c) විකුණුම් කොමිස් රු.100,000/- ට වැඩි නම් එය මත විශේෂ ආදායම් බද්දක් අය කෙරේ. විකුණුම් කොමිස් ආදායම රු.100,000/- ට වැඩි වූ විට 30% ක අනුපාතයකට එයින් බදු අයකෙරේ.

අංක E1001 දරණ සේවකයා සඳහා මෙම බද්ද ගණනය කිරීමට I3 කෝෂය සඳහා සූත්‍රය **හඳුනා දක්වන්න.**
(ලකුණු 03)

(d) වැඩ පත්‍රිකාවක H6 කෝෂයේ වටිනාකම රු.12,345.67 කින් සමන්විත වන්නේනම්, පහත සඳහන් එක් එක් ශ්‍රිතයන්ගෙන් ප්‍රතිඵල ලෙස ලැබෙන වටිනාකම **හඳුනා දක්වන්න**.

(i) ROUND(H6,1)

(ii) ROUND (H6,-1)

(iii) ROUNDUP(H6,0) (ලකුණු 03)

(මුළු ලකුණු 15)

## 04 වන ප්‍රශ්නය

වෘත්තිය ගණකාධිකරණ සුදුසුකමක් සඳහා විභාග පවත්වන අධ්‍යාපන ආයතනයක විභාග කළමනාකරු ඔබ යැයි උපකල්පනය කරන්න. පහත සඳහන් විද්‍යුත් තැපැල (email) ශිෂ්‍යයෙකුගෙන් ඔබ වෙත ලැබී ඇත:

| | |
|---|---|
| ගෙන් (From): | siribiris.perera@gmail.com |
| වෙත (To): | exams@institute.org |
| පිටපත් (CC): | registration@institute.org |
| විෂය (Subject): | ගිණුම්කරණ විෂයෙන් නිදහස් කිරීම |
| පණිවුඩය (Message): | ගිතවත් මහත්මයාණෙනි / මහත්මියනි,<br>මම ඔබ ආයතනයෙහි ලියාපදිංචි වී අදියර I 2018 සැප්තැම්බර් විභාගය සඳහා අයදුම් කළෙමි. මා හට අ.පො.ස. (උ/පෙ) විභාගයේ ගිණුම්කරණය සඳහා "A" සාමාර්ථයක් ලැබී ඇති නිසා, අදියර I ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීම අවශ්‍ය නොවන බව ඔබ ආයතනය විසින් දන්වා තිබුණි. මෙය මට පැහැදිලි කර දී, මෙම නිදහස්වීම ලබාගැනීමට සුදුසුකම් තිබේදැයි දැනගැනීමට කැමැත්තෙමි. ඒ අනුව මගේ විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කරන්නේනම්, මම අගය කරමි.<br>මෙයට විශ්වාසී,<br>**සිරිබිරිස් පෙරේරා**<br>ලියාපදිංචි අංක A12345<br>ප.ලි.  පරික්ෂා කිරීම සඳහා මගේ අ.පො.ස. (උ/පෙ) ප්‍රතිඵලවල පිටපත මේ සමඟ එවමි. |
| අත්සන් පාඨය:<br>(Signature Text): | සිරිබිරිස් පෙරේරා<br>ගිණුම් සහකාර, **ABC මූල්‍ය ආයතනය**, කොළඹ. |
| ඇමුණුම්:<br>(Attachments): | GCELAL.PDF |

පහත සඳහන් තොරතුරු ද ඔබ වෙත සපයා ඇත:

අධ්‍යාපන ආයතනයෙහි ඇමතුම් විස්තර:

වෘත්තිය ගණකාධිකාරී ආයතනය, අංක 15, හයිලෙවල් පාර, නුගේගොඩ.

දූරකතන / ෆැක්ස්  +94 112 345 678.

ශිෂ්‍යයා විසින් එවා ඇති පණිවුඩයට පිළිතුරු ලෙස පහත සඳහන් පණිවුඩය ඔහු වෙත සන්නිවේදනය කිරීමට විද්‍යුත් තැපැල් යැවීම පිළිබඳ ඔබේ දැනුම **භාවිත කරන්න.** අධ්‍යාපන ආයතනයේ විද්‍යුත් තැපැල් ප්‍රතිපත්තියට අනුව ශිෂ්‍යයන් සමඟ කෙරෙන සියලුම ලිපිගනුදෙනු ශිෂ්‍ය කටයුතු භාර කළමණාකරු (studentaffairs.mgr@institute.org) වෙත පිටපත් කිරීම අපේක්ෂා කරන බව ඔබට උපකල්පනය කළ හැකිය. පහත (a) සිට (h) දක්වා හඳුනා දක්වා ඇති අයිතම සඳහා සුදුසු තොරතුරු ඔබගේ උත්තර පොතේ ලිවිය යුතුය. ඔබ විසින් උපකල්පන කිසිවක් කරනු ලැබේ නම් ඒවා සඳහන් කරන්න.

| | | |
|---|---|---|
| ගෙන් (From): | …………………… (a) …………………… | (ලකුණු 02) |
| වෙත (To): | …………………… (b) …………………… | (ලකුණු 02) |
| පිටපත (CC): | …………………… (c) …………………… | (ලකුණු 02) |
| විෂය (Subject): | …………………… (d) …………………… | (ලකුණු 02) |
| පණිවුඩය (Message): | හිතවත් …………………… (e) …………………… මහත්මයාණෙනි,<br><br>විද්‍යුත් තැපැල පිළිබඳව ඔබට ස්තුතියි. ඔබගේ විභාග ප්‍රතිඵල අපි පරීක්ෂා කළ අතර, අදියර I හි ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට ඔබ පෙනී සිටිය යුතු නොවන බව සනාථ කරමු. අදියර I සඳහා යාවත්කාලීන කළ ඔබේ ප්‍රවේශ පත්‍රය කල් නොයවා තැපෑලෙන් ඔබ වෙත ලැබෙනු ඇත. ප්‍රවේශ පත්‍රයේ PDF පිටපතක් මේ සමඟ අමුණා ඇත.<br><br>ඔබට තවදුරටත් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන මගේ දුරකතන අංකයට අමතන්න.<br><br>මෙයට විශ්වාසී,<br><br>…………………… (f) …………………… | (ලකුණු 01)<br><br>(ලකුණු 02) |
| අත්සන් පාඨය: (Sinature Text): | …………………… (g) …………………… | (ලකුණු 02) |
| ඇමුණුම් (Attchments): | …………………… (h) …………………… | (ලකුණු 02) |

(මුළු ලකුණු 15)

## 05 වන ප්‍රශ්නය

(a) අද තිබෙන බොහෝ ජාල පිරික්සුම්වල (web browsers) අලුත් පිරික්සුම් වින්ඩෝවක් (new browsing windows) විවෘත කර ගැනීමට "Incognito Window", "Private Window" ආදී වශයෙන් සඳහන් වන විකල්පයක් (option) තිබේ.

නිත්‍ය පිරික්සුම් වින්ඩෝවකට (regular browsing window) සාපේක්ෂව එබඳු වින්ඩෝවක වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) ජාල පිරික්සුමක ප්‍රතිප්‍රවේශනය (reload) / පිබිදවීම (refresh) යන විකල්පයකින් (option) ඉටු කෙරෙන කාර්යය **හඳුනා දක්වන්න**. ඔබ මෙම විකල්පය භාවිත කිරීමට ඉඩ ඇති තත්ත්වයකට උදාහරණයක් දෙන්න. (ලකුණු 03)

(c) VPN යනු අන්තර්ජාලයට සම්බන්ධ වන විට ප්‍රයෝජනවත්වන තාක්ෂණයක් සනිටුහන් කිරීමට භාවිත කෙරෙන කෙටි යෙදුමකි.

VPN යන පදයෙන් අදහස් වන තේරුම සහ එයින් ඉටුවන අරමුණ **සඳහන් කරන්න.** (ලකුණු 03)

(d) "නිතිපතා යොදන පරිශීලක නම් සහ මුරපද හැර වෙනත් පියවර (measures) භාවිතයෙන් සමහර අන්තර්ජාල හෝ ජංගම බැංකු අඩවිවලට (sites) ප්‍රවේශ විය හැකිය."

ඔබට මෙම ප්‍රකාශනය සමඟ එකඟවිය හැකිදැයි **සඳහන් කරන්න**. ඔබේ උත්තරය සාධාරණීකරණය කරන්න. (ලකුණු 03)

(e) මෙම ප්‍රශ්නයේ දකුණු පසින් පෙන්වා ඇති රූපය වැනි දෑ ප්‍රවෘත්ති පත්‍රවල සහ ප්‍රවර්ධන පත්‍රිකාවල ජනප්‍රියව පවතී.

මෙවැනි රූපවලට දී ඇති නම **හඳුනා දක්වා** ඒවායේ භාවිතය (use) සඳහා උදාහරණයක් **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 15)

## 06 වන ප්‍රශ්නය

ව්‍යාපාරික ප්‍රවර්ධනයක් සඳහා පත්‍රිකාවක් සැලසුම් කිරීමේ (designing) කාර්යය (task) ඔබට පවරා ඇතැයි උපකල්පනය කරන්න. අවසාන ආකෘතිකරණය කිරීමෙන් පසු පත්‍රිකාව (final formatted leaflet) පහත රූපයේ දැක්වේ:





අකුරු වර්ගය (font type) වෙනස් කිරීමක් නොමැතියැයි උපකල්පනය කරමින්, ඉහත පත්‍රිකාවෙහි එක් එක් මූලිකාංග අනුවර්තනය කිරීමට (to convert) භාවිත කරනු ලබන මයික්‍රොසොෆ්ට් වර්ඩ් අංග (features) **හඳුනා දක්වන්න**.

(a) මෙහි දී තිබෙන *"Sale"* ලෙස නම්කර ඇති රූපයේ පිළිබිඹුව (image) වෙනස් කිරීම.  (ලකුණු 02)


(b) *"REEMIX Mid-Year Clearance Sale"* පාඨයේ පෙනුම (appearance) වෙනස් කිරීම. (ලකුණු 02)

(c) *"50% "* පාඨයේ පෙනුම සහ ස්ථානය (position) වෙනස් කිරීම. (ලකුණු 03)

(d) මෙහි දී තිබෙන පිළිබිඹුවෙහි පෙනුම සහ ස්ථානය වෙනස් කිරීම.  (ලකුණු 03)

(e) *"Hurry Up offer until stocks last or until 1st August 2018 Only"* පාඨය, රූපක සටහනක් තුළ (within a graphic) ප්‍රදර්ශනය කිරීම. (ලකුණු 03)

(f) දුරකතන අංකයේ පෙනුම සහ ස්ථානය වෙනස් කිරීම. (ලකුණු 02)

(මුළු ලකුණු 15)

## 07 වන ප්‍රශ්නය

(a) මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට්වල (Microsoft PowerPoint) හි, පහත දැක්වෙන අංගවලින් ඉටුකෙරෙන කාර්යය **පැහැදිලි කරන්න**:

(i) Handout Master.

(ii) Ink Annotations / Start Inking.

(iii) Add-Ins.

(iv) Online Pictures.

(v) Play Narrations.

(vi) Insert Icons. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

(b) සමාගමට පැමිණෙන විදේශීය ගැනුම්කරුවෙකුට ඔබගේ තේ අපනයන සමාගම පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට ඔබට නියම වී තිබේ. ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වන කාමරයේ මේසය මත තබන පරිගණකයක ඔබගේ ඉදිරිපත් කිරීම (presentation) තිබේ. පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමේ ගොනුව සාර්ථක ලෙස විවෘත කිරීමෙන් පසු ඔබට මවුසයේ සංචලනය (movement) අක්‍රිය වී මවුස් පොයින්ටරය (mouse pointer) එහා මෙහා කිරීමට නොහැකි බව දැනිණි. වෙනත් පරිගණක හෝ මවුසයන් නැතැයි උපකල්පනය කරන්න.

ඔබ ඉදිරිපත් කිරීම ආරම්භ කරන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 15)

*B කොටසෙහි අවසානය*